# ඇන්තූරියම් හා ඕකිඩ් මල් සඳහා බටහිර ජර්මනිය ඇතුළු අනිකුත් යුරෝපීය රටවල පවත්නා ඉල්ලීම හා ඒවා අපනයනය කිරීම සඳහා අප සංවිධානය වියයුතු ආකාරය

**පේරාදෙණියේ උද්භිද උද්‍යානයේ—උද්‍යාන සහකාර එච්. රාජපක්ෂ මහතා විසිනි**

ලෝකයේ මල් ආනයනය කරන රටවල් අතුරෙන් බටහිර ජර්මනිය මුලතැනක් ගනී. ස්විට්සර්ලන්තය හා ස්වීඩනය දෙවන-තෙවන ස්ථානයට පත්වේ. ජර්මන් වැසියන් සිය දෛනික ජීවිතයේ විවිධ අවස්ථා සඳහා මල් භාවිතා කරනු ලැබේ.

බටහිර යුරෝපීය රටවල වැසියන් ඇන්තූරියම් හා ඕකිඩ් මල් ප්‍රධාන වශයෙන් සිංගප්පූරුව, තායිලන්තය වැනි රටවලින් ගෙන්වා ගන්නා අතර, එම රටවල වැවිය හැකි මල් වර්ග ව්‍යාප්ත කිරීමද සිදු කෙරේ. මෙම රටවල වැවිය හැකි මල් වර්ග අලෙවිය ද ඉහළින් පවතින අතර, කලක් තබා ගැනීමේ ශක්තිය නිසා ඇන්තූරියම් හා ඕකිඩ් මල් භාවිතය බොහෝ දෙනා තුළ ජනප්‍රිය වී ඇත. වැඩිවන ජනගහනය හා උසස් ජීවන තත්ත්වය නිසා අවුරුදු පතා මෙම රටවල් මල් ගෙන්වීම සඳහා විශාල මුදල් ප්‍රමාණයක් වැය කරනු ලබේ. මේ නිසා මල් පිටරට යැවීමේ වටිනා අවස්ථාවක් ශ්‍රී ලංකාව සතුව ඇත.

**1968 හා 1970 යන වර්ෂවලදී බටහිර යුරෝපීය රටවල් ආනයනය කර ඇති මල්වල වටිනාකම**

| | 1968 ඩොලර් දශලක්ෂ | 1970 ඩොලර් දශලක්ෂ |
|---|---|---|
| බටහිර ජර්මනිය | 69.0 | 109.6 |
| ස්විට්සර්ලන්තය | 9.6 | 12.0 |
| ස්වීඩනය | 7.7 | 8.7 |
| එක්සත් රාජධානිය | 4.5 | 3.6 |
| ප්‍රංශය... | 4.4 | 5.1 |
| ඔස්ට්‍රියාව | 2.9 | 4.2 |
| නෝර්වේ | 1.5 | 2.0 |
| ඉතාලිය | 1.3 | 3.0 |
| බෙල්ජියම | 0.9 | 2.2 |
| පින්ලන්තය | 0.8 | 1.0 |

මෙම රටවල් අතුරෙන් එක්සත් රාජධානිය හැර අනිකුත් රටවල් මල් ගෙන්වීම 1967 වර්ෂයේ දීට වඩා 1970 දී වැඩිවී ඇති බව පෙනේ.

| | |
|---|---|
| බෙල්ජියම (ජර්මන් මාර්ක්ස්) ... ... | 36,403.00 |
| ඩෙන්මාර්කය (ජර්මන් මාර්ක්ස්) ... ... | 28,234.00 |
| පෘතුගාලය (ජර්මන් මාර්ක්ස්) ... ... | 5,370.00 |
| බටහිර ජර්මනිය (ජර්මන් මාර්ක්ස්) ... ... | 3,105.00 |
| තායිලන්තය (ඩොලර්) ... ... ... | 9,408.00 |
| සිංගප්පූරුව (ඩොලර්) ... ... ... | 7,603.00 |
| ශ්‍රී ලංකාව (ඩොලර්) ... ... ... | 489.00 |

### ඉහත සඳහන් වෙළඳ පොලෙහි අලෙවි කරන ලද මල්වල මිළ ගණන් (1973 අප්‍රෙල්—ජූනි)

| | වටිනාකම |
|---|---|
| රතු හා තැඹිලි පාට ඇන්තූරියම් මලක් 5''—6'' ... ... | රු. 12 00—15 00 |
| රතු හා තැඹිලි පාට ඇන්තූරියම් මධ්‍යස්ථ මලක් 4''—5'' ... ... | රු. 9 00—10 00 |
| ඩෙන්ඩ්‍රෝබියම් මල් කිනිති 6ක් ... ... ... | රු. 42 00—48 00 |
| ඩෙන්ඩ්‍රෝබියම් සුදු පාට මල් කිනිති 5 ... ... ... | රු. 60 00 |
| ඇරැන්ඩා වෙන්ඩිස්කොට් කිනිති 2 ... ... ... | රු. 15 00—18 00 |
| ඇරැන්තිරා ජේම්ස්ටෝරි කිනිති 5 ... ... ... | රු. 45 00 |
| ඔන්සිඩියම් (ගෝල්ඩන් ෂවර්) කිනිති 5ක් ... ... | රු. 45 00 |
| ඇරැක්නිස් මැගිවි කිනිති 10 ... ... ... | රු. 24 00—30 00 |
| වැන්ඩා රොක්වල්ඩියානා කිනිති 5ක් ... ... ... | රු 60 00—75 00 |
| වැන්ඩා මිශ්‍ර කිනිති 5ක්... ... ... ... | රු. 45 00 |
| කැට්ලියා මලක් ... ... ... ... | රු. 18 00—24 00 |
| පැලනොප්සිස් මලක් ... ... ... ... | රු. 6 00— 7 50 |
| සිම්බිඩියම් මලක් ... ... ... ... | රු. 6 00— 7 50 |
| ඔඩොන්ටොග්ලොසම් මලක් ... ... ... | රු. 6 00 |
| සිප්‍රිඩියම් මලක් ... ... ... ... | රු. 15 00—18 00 |

ඉහත සඳහන් මිළ ගණන් ශීත සෘතුවේ දී බෙහෙවින් වැඩිවේ.

**1968 වර්ෂයේ දී ප්‍රධාන පෙළේ මල් පිටරට යවන රටවල් අපනයනය කර ඇති මල්වල වටිනාකම**

| | ඩොලර් දශලක්ෂ |
|---|---|
| නෙදර්ලන්තය ... ... ... | 59.6 |
| ඉතාලිය ... ... ... | 32.0 |
| ප්‍රංශය ... ... ... | 5.0 |
| ඊශ්‍රායලය ... ... ... | 3.2 |
| අමෙරිකා එක්සත් ජනපදය ... ... | 1.8 |
| ඩෙන්මාර්කය ... ... ... | 1.1 |
| සිංගප්පූරුව ... ... ... | 0.3 |
| තායිලන්තය ... ... ... | 0.3 |

ලෝකයේ මල් පිටරට යවන රටවල් අතුරෙන් නෙදර්ලන්තය මුල් තැනක් ගනී. ඉහත සඳහන් රටවල අතුරෙන් සිංගප්පූරුව හා තායිලන්තය හැර අනිකුත් රටවලින් නිවර්තන කලාපීය ඕකිඩ් වර්ග අපනයනය නොකෙරේ. එම රටවල එවැනි ඕකිඩ් වර්ග වැවීම දුෂ්කර වේ. මේ නිසා ශ්‍රී ලංකාවෙහි එම වර්ග වවා ව්‍යාප්ත කොට මල් පිටරට යැවීමේ අවස්ථාව තිබේ.

බටහිර බර්ලිනයේ වෙළඳ මධ්‍යස්ථානයෙහි එක් මල් වෙළෙන්දෙකු පමණක් 1972 ශීත සෘතුවේදී (ඔක්තෝබර්—අප්‍රේල්) විවිධ රටවලින් ගෙන්වන ලද ඇන්තූරියම් හා ඕකිඩ් මල්වල වටිනාකම—

වටිනාකම

### බටහිර ජර්මනියේ මල් අලෙවිය සංවිධානය කර ඇති ආකාරය

මල්වල පවත්නා පරවෙන ස්වභාවය නිසා ඒවා ප්‍රධාන වශයෙන් බෙදාහරිනු ලබන්නේ මල් අලෙවිය සඳහා පමණක් ප්‍රධාන නගරවල පිහිටුවා ඇති තොග වෙළඳ ශාලාවන් මගින්ය.

ගුවන් මගින්
මල් ගෙන්වනු ලබන රට ————→ තොග වෙළඳ ශාලාව ——→ කුඩා මල් ශාලාව ——→ පාරිභෝගිකයා

සෑම විශාල නගරයකම පිහිටුවා ඇති මල් සඳහා වන තොග වෙළඳ ශාලාවල විශාලත්වය එම නගරයෙහි ඇති ජනගහනය හා කුඩා මල්ශාලා අනුව වෙනස් වේ.

බටහිර බර්ලිනයේ මල් වෙළඳ ශාලාව වර්ෂ 1886 දී පිහිටුවන ලද්දකි. එහි විශාලත්වය වර්ග මීටර් 0,436 වන අතර, විවිධ මල් වර්ග රැස්කොට තබන කුඩා කාමර 257 තිබේ. මෙම වෙළඳ සැලෙන් මල් බෙදා හරිනු ලබන්නේ කුඩා මල් ශාලා හිමියන්ට පමණි. මෙහි ඕකිඩ් හා ඇන්තූරියම් මල් බෙදාහරිනු ලබන එක් වෙළෙන්දෙකු සිටී. ඇය ශ්‍රී ලංකාව ඇතුළුව පහත සඳහන් රටවලින් විවිධ ඕකිඩ් වර්ග හා ඇන්තූරියම් මල් ගෙන්වනු ලබේ.

ශ්‍රී ලංකාව—ඩෙන්ඩ්‍රෝබියම්, වැන්ඩා හා ඇන්තූරියම් මල්

තායිලන්තය— ප්‍රධාන වශයෙන් ඩෙන්ඩ්‍රෝබියම් වර්ග

සිංගප්පූරුව—ඇරන්ඩා, ඇරන්තීරා හා ඇරැක්නිස් මැගිව් ඇතුළු මිශ්‍ර ඕකිඩ් වර්ග.

බටහිර ජර්මනිය, ඩෙන්මාර්කය, ඕස්ට්‍රේලියාව, පෘතුගාලය, බෙල්ජියම—සිම්බිඩියම්, කැට්ලියා, සිප්‍රිපීඩියම්, පැලනොප්සිස් හා ඔඩොන්ටොග්ලොසම්.

### ජර්මන් වැසියන් මල් පරිභෝජනය කිරීම

බටහිර ජර්මනියේ මල් හා මල් පැල වර්ග බහුල වශයෙන් ප්‍රයෝජනයට ගනු ලබන්නේ මධ්‍යස්ථ හා ඉහළ ආදායමක් ලබන වැසියන් වෙති. යුරෝපීය රටවල් අතුරෙන් ඔවුන් විශාලතම මල් ප්‍රමාණයක් අවුරුදු පතා පාවිච්චියට ගනු ලැබේ.

මිත්‍රයින් හා ලෙඩුන් හමුවට යාමේදී, මංගල්‍යය හා අවමංගල්‍යය අවස්ථාවලදීද, ජාතික උත්සව හා වෙනත් සාද යන්හිදීද, ප්‍රධාන වශයෙන් මල් භාවිතා කරනු ලැබේ. බොහෝ සැමියන් සති අන්තයේදී සිය බිරිඳට මල් කළඹක් ගෙනගොස් තෑගි කිරීම ජර්මන් වැසියන්ගේ සිරිතකි.

**බටහිර ජර්මනියේ විවිධ නගරවල එක් වැසියෙකු එක් වර්ෂයකට මල් සඳහා වියදම් කරන සාමාන්‍ය මුදල් ප්‍රමාණය**

| | රු. | | රු. |
|---|---|---|---|
| බර්ලිනය ... ... | 124.8 | හසන් ... ... | 28.1 |
| හැම්බර්ග් ... ... | 106.5 | රයින්ලැන්ඩ් ... ... | 20.1 |
| බ්‍රීමන් ... ... | 57.9 | සාර්ලැන්ඩ් ... ... | 21.9 |
| උතුරු රයින් ... ... | 47.9 | බෙඩන් වුර්ටම්බර්ග් ... | 22.4 |
| ෂ්ලෙස්විග් ... ... | 39.9 | බෙයන් ... ... | 21.00 |
| නීඩර් සැෂු ... ... | 33.0 | | |

බටහිර බර්ලිනයෙහි මල් අධික වශයෙන් පාවිච්චියට ගනු ලබන ජාතික උත්සව දිනයන්

| | | |
|---|---|---|
| ජනවාරි 1 | — | අලුත් අවුරුද්ද |
| අප්‍රේල් 20 | — | මහ සිකුරාදා |
| අප්‍රේල් 23 | — | ඊස්ටර් සන්ඩේ |
| අප්‍රේල් 24 | — | ඊස්ටර් මන්ඩේ |
| මැයි 13 | — | මැනිවරුන්ගේ දිනය |
| නොවැම්බර් 1 | — | ආත්මයන්ගේ දිනය |
| දෙසැම්බර් 24, 25 | — | නත්තල් දින |
| දෙසැම්බර් 31 | — | අලුත් අවුරුදු පෙර දිනය |

ඉහත සඳහන් උත්සව දිනයන්හි මහජනයා විශේෂයෙන් මල් මිලදී ගනී. මෙම දිනයන්හිදී අලෙවිය සඳහා තමන්ට අවශ්‍ය මල් ප්‍රමාණය, මල් සපයනු ලබන රටවලට කල් ඇතිව දන්වනු ලැබේ. මේ අනුව මල් සපයන රටවලට ඔවුන්ගේ අවශ්‍යතාවයන් සපුරාලීමට හැකිවිය යුතු වේ. එසේ අවශ්‍ය මල් ප්‍රමාණය සැපයීමට අපොහොසත් වුව හොත් ඔවුන්ගේ ඇනවුම් අවලංගු කිරීමට මල් වෙළෙන්දන්ට සිදුවේ. මේ නිසා මල් පිටරට යැවීමේදී එරට වෙළෙන්දන් සමඟ ගිවිසගත් පරිදි ඔවුන්ට අවශ්‍ය මල් ප්‍රමාණය උසස් තත්ත්වයෙන් නියමිත දිනවලදී ලැබෙන්නට සැලැස්වීම ඉතා වැදගත්වේ.

**විවිධ ඍතුවලදී මල් සඳහා ඇති ඉල්ලීම**

**ශීත ඍතුව—ඔක්තෝබර් 22—මාර්තු 19 දක්වා**

**වසන්ත ඍතුව—මාර්තු 20—ජුනි 20 දක්වා**

**උෂ්ණ ඍතුව—ජුනි 21—සැප්තැම්බර් 22 දක්වා**

**සරත් ඍතුව—සැප්තැම්බර් 23—ඔක්තෝබර් 21 දක්වා**

**ශීත ඍතුව**

මල් සඳහා අතිවන ඉල්ලීම හා වෙළඳාම අවුරුද්දේ විවිධ ඍතු අනුව වෙනස් වේ. ශීත ඍතුවේ පවතින අධික ශීතල නිසා යුරෝපීය රටවල එළිමහනේ කිසිදු මල් වර්ගයක් වැවීමට නොපිළිවන. මේ නිසා මේ කාලය තුල ඕකිඩ් හා ඇන්තූරියම් ඇතුළු වෙනත් මල් වර්ග විශාල වශයෙන් ගෙන්වීමට සිදුවේ. එබැවින් මල් පිටරට යවන රටවල් ශීත ඍතුවේදී හැකිතරම් විශාල මල් තොගයක් සැපයීමට සූදානම් විය යුතුවේ. මේ කාලයේ ශ්‍රී ලංකාවෙන් ද විශාල මල් ප්‍රමාණයක් සැපයීමට පිළිවන්වේ. දැනට සපයනු ලබන්නේ සුළු මල් ප්‍රමාණයක් පමණි.

**වසන්ත ඍතුව**

මේ කාලයේ දී දේශගුණය යහපත්වීමක් සමඟ ගොවියන් සිය තවාන්වල මල් වැවීම ආරම්භ කරනු ලැබේ. එහෙත් සලකිය යුතු මල් ප්‍රමාණයක් ගෙන්වීමට සිදුවේ.

**උෂ්ණ ඍතුව**

වසන්ත ඍතුවේදී වගාකරන ලද ප්‍රාදේශීය මල් වර්ගවලින් වෙළඳ ශාලා පිරීයයි. පිටරටින් මල් ගෙන්වීම බොහෝ දුරට අඩුකරනු ලැබේ. එහෙත් ඕකිඩ් හා ඇන්තූරියම් මල් වර්ග සමහර වෙළඳ ශාලාවලට ගෙන්වීම අවුරුද්ද මුලුල්ලේම කරගෙන යනු ලැබේ.

**සරත් සෘතුව**

මේ කාලයේදී ඇතිවන අයහපත් දේශගුණික තත්ත්වය නිසා නැවතත් පිටරටින් මල් ගෙන්වීම පටන් ගැනේ.

මේ අනුව අවුරුද්දේ සුළු කාලයක හැර බොහෝ මාසවල ඇන්තූරියම් හා ඔකිඩ් මල් වර්ග සැපයීමට පිළිවන. මේ සඳහා ශ්‍රී ලංකාවේ මල් වවන්නන් පැල බෝකර වැඩි මල් නිෂ්පාදනයක් ඇති කිරීමට සූදානම් විය යුතුය.

**මල් සඳහා ඇති ඉල්ලීම සෑහීක කළ හැකිද ?**

යුරෝපීය රටවල මල් පාරිභෝගිකයන්ගේ ආදායම් තත්ත්වය ඉහළයාම හා වැඩි වන ජනගහනය අනුව මල් භාවිතය අවුරුදු පතා වැඩිවනු ඇත. මේ රටවලට පසුගිය අවුරුදු කීපය තුළ ගෙන්වන ලද මල් ප්‍රමාණය අනුව මේ බැව් පෙනේ.

1955 සිට 1968 දක්වා කාලය තුළ බටහිර යුරෝපීය රටවල සියයට 464 කින් මල් ආයනයන කිරීම වැඩිවී ඇත.

**ජපන් රටෙහි ඉල්ලීම**

මෑතක සිට ජපන් රටද විශාල වශයෙන් ශ්‍රී ලංකාවෙන් මල් ගෙන්වා ගැනීමට කැමැත්ත පළකොට තිබේ. එහි තොගවෙළඳ ශාලාවක එක් මල් වෙළෙන්දෙක් සතියකට ඇන්තූරියම් මල් 6,000 ක් සපයන ලෙස ඉල්වා තිබේ. මෙය ඉදිරි වර්ෂ තුළදී 18,000 දක්වා වැඩිකරන බැව් පවසා ඇත. එහෙත් මීන් අඩක්වත් ශ්‍රී ලංකාවට සැපයීම දුෂ්කර වේ. ජපන් වැසියන් වැඩිපුර අගය කරනු ලබන්නේ ඔරේන්ජ් සුදු හා කොරල් රෝස වැනි පාට වලටය. රතු ඇන්තූරියම් වලට එතරම් ඉල්ලුමක් නැත. කහපාට සහ සුදු ඕකිඩ් මල්වලට ද ඔවුන් රුචියක් දක්වති.

මේ නිසා විශේෂයෙන් ඇන්තූරියම් හා ඔකිඩ් මල්වලට ඉදිරි අනාගතයේදී ඉල්ලීමක් තිබේ. එකම බාධකය වී ඇත්තේ අවශ්‍ය තරම් මල් අප රටෙහි තවම නිෂ්පාදනය නොවීමයි.

**සිංගප්පූරුව හා තායිලන්තය**

ඔකිඩ් මල් අපනයනය කිරීමේදී අපට තරග කිරීමට සිදුවනුයේ සිංගප්පූරුව හා තායිලන්තය සමඟයි. සිංගප්පූරුව හා තායිලන්තයට වඩා ශ්‍රී ලංකාව යුරෝපයට ආසන්නව පිහිටා ඇති බැවින්, මල් අපනයන කිරීමේ දී පැය 3 ක ගුවන් ගමන් කෙටිවීමක් ඇතිවේ. මේ නිසා මල් සඳහා ගුවන් ගාස්තුව අඩුවේ. එබැවින් සෑහෙන පමණ මල් නිෂ්පාදනයක් ඇත්නම් අපේ මල් ගැනීමට යුරෝපා රටවල වෙළෙන්දන් කැමැති වනු ඇත.

දැනට සිංගප්පූරුවේ පවතින උග්‍ර ඉඩම් හිඟය නිසා ඔවුන් සතුව පවත්නා ඕකිඩ් පැල තවත් පුළුල් කිරීමට නොහැකි තත්ත්වයක පවතී. එහෙත් අපහට මල් වැවීමේ ව්‍යාපාරය පුළුල් කිරීමේ ඉඩකඩ පහසුවෙන් ලබාගත හැකිවේ.

මේ අනුව බලනවිට මල් වගා ව්‍යාපාරය කෙරෙහි උනන්දුවක් දක්වන සෑම දෙනාම, මෙය පුළුල්කොට බොහෝ දෙනා අතරට ව්‍යාප්ත කර වැඩි මල් නිෂ්පාදනයක් ඇති කොට මල් අපනයනය කර එමගින් අප රටට අවශ්‍ය විදේශ විනිමය ලබාගන්නට උත්සාහ කළ යුතුය.

(8) එම වෙළෙන්දන් ඉල්වන ප්‍රමාණය නියමිත දිනට අපනයන කළ යුතුය.

(9) මෙම මල් පැය 24—48 තුළදී එම රටට ළඟාවිය යුතුය. පැය 24 තුළදී ළඟාවේ නම් ප්‍රශස්ත වේ.

(10) කිසිදු හානියක් නොවී ක්‍රමානුකූලව මල් අසුරාලීම ඉතා වැදගත් වේ. මේ සඳහා විශේෂයෙන් සංවිධානය වූ කාර්ය මණ්ඩලයක් අවශ්‍ය වේ.

(11) මල් අසුරාලීමට අවශ්‍ය කාඩ්බෝඩ් පෙට්ටි ඇතුළු සියළුම ද්‍රව්‍ය පහසුමිළට වෙළඳපොලෙන් ලබාගත හැකි විය යුතුය.

(12) මල් පිටරට යැවීමේ දී ඇතිවන පමාවන් වලක්වා ලීමට ගුවන් තොටුපොලේදී විශේෂ විධිවිධාන සැලැස්වීම වැදගත් වේ.

## ශ්‍රී ලංකාවෙහි මල් වගාව නංවාලීමට ගතයුතු පියවර

(1) වැඩිදුර මල් නිෂ්පාදනය සඳහා දැනට මල් වවන්නන් සතුව තිබෙන ඕකිඩ් හා අන්තූරියම් මල්පැල බෝකිරීම නොකඩවා කළ යුතුය.

(2) වාණිජමය පදනමක් මත මල් වවන්නන් අලුත් දෙමුහුන් වර්ග නිපදවා ඒ ඒ රටවල ජනයාගේ රුචිකත්වය අනුව විවිධ වර්ණයෙන් හා හැඩයෙන් යුත් මල් වර්ග අපනයනය කිරීමට සූදානම් විය යුතුය.

(3) ඇස්කොසැන්ඩා වර්ග වැඩිදියුණු කොට අනාගතයේදී පිටරට යැවීමට සූදානම් වීම වැදගත් වේ. දැනටමත් තායිලන්තයේ මල් තවාන්වල මෙම වර්ගය පිටරට යැවීමේ පරමාර්ථයෙන් සීග්‍රයෙන් බෝකරනු ලැබේ.

(4) දැනට ශ්‍රී ලංකාවෙහි විවිධ ප්‍රදේශවල මල් වගාව කෙරෙන බැවින් මල් එකතු කිරීමේ මධ්‍යස්ථාන ඇතිකොට ඒවා හැකි ඉගස අසුරාලීමේ මධ්‍යස්ථානයට ගෙන ඒමට කටයුතු සංවිධානය කළ යුතුවේ.

(5) නොකඩවා විශාල මල් ප්‍රමාණයක් සැපයීමට පුලුවන් වූ විට (වරකට කිලෝ ග්‍රෑම් 45 ඉහලින්) සහනදායක ගුවන් ගාස්තු සඳහා ගුවන් සමාගම් සමඟ සම්මුතියකට එළඹිය යුතුය.

(6) ශ්‍රී ලංකාවේ මල් පිළිබඳව යුරෝපීය රටවල තානාපති කාර්යාල මඟින් පුළුල් ප්‍රචාරයක් කළ යුතුය. විවිධ රටවල මල් ශාලා වලින් ඇනවුම් ලබාගැනීමට තානාපති කාර්යාල වලින් ඉතා පහසුවේ.

(7) පිටරට යවනු ලබන මල් කිසිදු තුවාලයක්, රෝගයක් නොමැති හොඳාකාර මේරූ අනර්ඝ තත්ත්වයෙන් විය යුතුය.